# කාන්තාවන් දියුණු වුවහොත් සමාජය ද දියුණු වනු ඇත.

මින් අවුරුදු සියයකටත් වැඩි කාලයකට පෙර වාර්ෂික සම්ප්‍රදායක් ලෙස ජාත්‍යන්තර කාන්තා දිනය ආරම්භ වූයේ ශ්‍රම බලකායේ කාන්තා කාර්යභාරයට ගරු කිරීමට, දේශපාලන අයිතීන් වෙනුවෙන් පෙනී සිටීමට හා වැඩපොළේ වෙනස් ලෙස සැලකීම අවසන් කිරීම ආදිය සඳහායි. සෑම වර්ෂයක ම මාර්තු 8 වැනිදා ලොව පුරා ජනතාව, මේ අතින් ලබා ඇති ප්‍රගතිය මෙනෙහි කිරීමට, අවශ්‍ය පරිවර්තන ඉල්ලා සිටීමට, ඔවුන්ගේ රටවල් හා ප්‍රජාව තුළ වෙනසක් සිදු කරන කාන්තාවන්ගේ ධෛර්ය හා අධිෂ්ඨානයට උපහාර පුද කිරීමට හා කාන්තාවන්ගේ සාර්ථකත්වය සහතික කිරීමට වැඩි ප්‍රයත්නයක් දරන ලෙස ඉල්ලා සිටීමට මෙය අවස්ථාවක් කර ගනී සෑම රටක ම කාන්තාවන් සමෘද්ධිමත් වන විට මුළු සමාජය ම සමෘද්ධිමත් වේ. බාලිකාවන් හා හා කාන්තාවන්ට අධ්‍යාපනය ලබා දෙන විට මුළු සමාජය ම දැනුවත් වී සමෘද්ධිමත් වේ.

අපි කාන්තා අයිතීන් සමරමින් ඔවුන් බලවත් කිරීමට තැත් කරන අතරම ඔවුන්ට මුහුණ දීමට සිදු වී ඇති බාධක අවබෝධ කර ගැනීම ද වැදගත් වේ. අප සියලු දෙනාට ම ලබාගත හැකි අවස්ථාවන් කෙරෙහි ලිංගිකත්වය බොහෝ විට බලපායි. නිවසේ කාර්යභාරයේ සිට අධ්‍යාපනය හා රැකියා ආදී සෑම අංශයක ම ඔවුන්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කිරීමේ දී කාන්තාවන්ට දිගටම සමාජීය හා ආයතනික බාධකවලට මුහුණ දීමට සිදු වේ.

නිවසේ දී හෝ වැඩපොළේ දී කාන්තාවන්ට වැඩිපුර අවස්ථා ලබා දීමට කටයුතු කිරීම සියලු ම ජනයාට ඉතා වැදගත් වේ. තරුණ නොබෙල් ත්‍යාගලාභී මලාලා යුසෆාසි ප්‍රකාශ කර ඇති පරිදි “ජනයාගෙන් අඩකට ඉඩ නො දෙන විට අප සියලු දෙනාට ම සාර්ථක විය නො හැක”. මිනිස් වර්ගයාගේ අඩක සාර්ථකත්වය සහතික කිරීම සඳහා ඔවුන්ගේ හැකියාවන් සම්පූර්ණයෙන් ප්‍රයෝජනයට ගැනීමේ අවස්ථාව උදා කර දීම සඳහා තම ගැහැණු නෑයන්ට ආධාර කිරීමේ වගකීමක් සෑම ස්වාමිපුරුෂයෙකුට, පියෙකුට, සහෝදරයෙකුට හා පුතෙකුට තිබේ.

ඇත්ත වශයෙන් ම ඕනෑම ආර්ථිකයක මිනිස් ප්‍රාග්ධනයෙන් අඩක් කාන්තාවන් වන නිසා. විධිමත් ආර්ථිකයට කාන්තාවන් ඇතුළු කර නො ගැනීමේ ප්‍රතිඵලය වන්නේ මුළු සමාජයේ ම ආදායම් මට්ටම පහළට යෑම හා දරිද්‍රතා මට්ටම ඉහළ යෑම බව අපි දනිමු. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට අනුව ශ්‍රම බලකායට සහභාගී වීමට කාන්තාවන්ට ඇති නෛතික බාධක හේතුවෙන් දළ දේශීය නිෂ්පාදනයට සියයට 30ක පමණ පාඩුවක් සිදු වේ. මැක්කින්සි ඇස්තමේන්තුවලට අනුව පිරිමින් ට සමාන තත්වයකින් ලොව පුරා කාන්තාවන් ආර්ථික කටයුතුවලට සහභාගි වූයේ නම් 2025 වන විට වාර්ෂික ගෝලීය දළ දේශීය නිෂ්පාදනය ඩොලර් ට්‍රිලියන 28කින් - එනම් එක්සත් ජනපදයේ හා චීනයේ වර්තමාන දළ දේශීය නිෂ්පාදනයට වඩා වැඩි ප්‍රමාණයකින්- වැඩි කර ගත හැකි වනු ඇත.

මේ ගැන සිතා බලන්න: සමානත්වය ලබා දීමෙන් ඩොලර් ට්‍රිලියන 28ක්. මේ නිසා 2016 ජාත්‍යන්තර කාන්තා දිනයේ තේමාව “සමානත්වයට ප්‍රතිඥාව” වීම පුදුමයට කරුණක් නොවේ.

ශ්‍රී ලංකාවේ සංඛ්‍යාලේඛනවලට අනුව “ආර්ථික වශයෙන් අක්‍රිය ජනගහණයෙන්” සියයට 69ක් නියෝජනය කරන්නේ කාන්තාවන් වන නමුත් ඔවුන් ආර්ථික වශයෙන් ක්‍රියාකාරී ජනගහණයෙන්” සියයට 34ක් පමණක් වේ. මෙම උපයෝගී කර නො ගත් ව්‍යවසායකත්වය, උත්සාහය, නවීකරණය හා

රැකියා සංචිතය රටේ සංවර්ධනය සඳහා යොදා ගත හැකි වේ. මුලින් ම සේවකයන් ලෙස වැඩිපුර කාන්තාවන් ආකර්ෂණය කර ගැනීමෙන් මෙන් ම ඔවුන් ව්‍යවසායකයන් හා සේවා යෝජකයන් බවට පත් කිරීමෙන් ආර්ථික වර්ධනය වැඩි වීමත්, අලුත් රැකියා අවස්ථා බිහි වීමත්, විශේෂයෙන්ම ගැහැණු දරුවන් ඇතුළු පවුල්වල ජීවන තත්වය වැඩිදියුණු වීමත් සිදු වනු ඇත.

ලෝකයේ කාන්තාවන් නායකත්වය දෙන, අති දක්ෂ හා ප්‍රවීණ ව්‍යාපාරවලින් සමහරක් ඇත්තේ එක්සත් ජනපදයේ වන අතර සංවර්ධන ආධාර මූලෝපායක් ලෙස ශ්‍රී ලාංකික කාන්තාවන් අතර ව්‍යවසායකත්වය වර්ධනයට එක්සත් ජනපදය දශක ගණනාවක් තිස්සේ ආධාර කර තිබේ. අපේ ව්‍යාපෘති තුළින්, කෘෂිකාර්මික හා කුඩා කර්මාන්ත අංශයේ ව්‍යවසායකයන් වීමට කාන්තාවන් පුහුණු කිරීම, ණය ලබා ගැනීමට පහසුකම් සැලසීම, වෙළඳපොළ ප්‍රසාරණය සඳහා සමාජීය හා ව්‍යාපාරික ජාල ගොඩ නැගීම ආදිය ඉටු කර තිබේ. එක්සත් ජනපදයෙන් ඉගෙන ගැනීමත්, නවීකරණ අදහස් හුවමාරු කර ගැනීමත් සඳහා අපි ප්‍රතිභාපූර්ණ ව්‍යාපාරික කාන්තාවන් එක්සත් ජනපදයට යවන අතර ආපසු ශ්‍රී ලංකාවට පැමිණීමෙන් පසු තමන් උගත් දේ අන් අයට ලබා දෙමින් අන් අයට ආදර්ශයක් ලෙස කටයුතු කිරීමට ඔවුන් දිරි ගන්වමු. ස්ත්‍රී මූලික නිවාස විශාල සංඛ්‍යාවක් ඇති, ගැටුමේ බලපෑමට ලක් වූ හා ආර්ථික වශයෙන් පසුගාමී ප්‍රදේශවල අලුත් කම්හල් පිහිටුවීමට අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද ආයතනය (USAID) තුළින් අපි දේශීය ව්‍යාපාර සමග එක් වී සහයෝගයෙන් කටයුතු කරමු.

මධ්‍යම පළාතේ සිට උතුරු පළාතට දිවෙන ඒ9 මාර්ගයේ මුලතිව්, මාන්කුලම් හි පිහිටි අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද ආයතනයේ (USAID) ආධාරයෙන් ඉදි කළ "වන්නියේ රස" නම් ගිමන්හල ට යන්න. කාන්තා ග්‍රාම සංවර්ධන සමිතියක් මගින් ක්‍රියාත්මක කරන මෙම ස්ථානයේ ආහාර පාන හා දේශීය අත්කම් විකිණීමෙන්, ආදායමක් උපයන ජීවන තත්වයක් ලබා ගැනීමට යුද වැන්දඹුවන්, තනි මව්වරුන් හා නිවාසවල මූලිකත්වය දරණ කාන්තාවන්ට අවස්ථාවක් ලබා දී තිබේ. මෙහි වැඩ කරන කාන්තාවන් සෑම දිනක ම ආදායම් උපදවමින් ඔවුන් අතර බෙදා ගන්නා ලාභයෙන් ඔවුන්ගේ දරුවන්ට පෝෂණයත්, අධ්‍යාපනයත් ලබා දෙයි.

මෙම මාර්ගයේ තවත් ඉදිරියට යන විට කිලිනොච්චියේ පිහිටා ඇති අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද ආයතනයේ (USAID) ආධාරයෙන් ඉදි කළ සිවනාරුල් වෘත්තිය පුහුණු හා නිෂ්පාදන මධ්‍යස්ථානය හමුවේ. මෙහි වැන්දඹුවන්, අනාථයන්, ආබාධිතයන් හා නිවාසවල මූලිකත්වය දරණ කාන්තාවෝ හාල් පිටි හා කුළුබඩු ඇඹිරීමේ කටයුතුවල නිරත වේ. මෙය හුදු ව්‍යාපාරයක් පමණක් නොව කාන්තාවන්ට සුරක්ෂිත තවාතැනක් හා ආදායම් මාර්ගයක් සලසා දෙමින් ප්‍රජාවේ වැඩිදියුණුවට කැපවීමකි.

නැගෙනහිර පළාතේ ලියාක් ඉන්ඩස්ට්‍රීස් ආරම්භ වූයේ සුළු පරිමාණයේ සෙරෙප්පු හා මලු නිෂ්පාදන ආයතනයක් ලෙසයි. අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද ආයතනයේ (USAID) ආධාර ඇති ව එය හම් සපත්තු නිෂ්පාදනය සඳහා නව කර්මාන්තශාලාවක් ආරම්භ කළේය. රැකියා අවස්ථා සීමිත ප්‍රදේශයක වැඩිපුර තරුණ කාන්තාවන්ට මේ මගින් ස්ථිර රැකියා ලබා දීමට හැකි විය. ඔවුන්ගේ අනාගත සැලසුම් වෙනුවෙන් ඉතිරි කිරීම දිරිගැන්වීමට, ඔවුන්ගේ වැටුප් සමාගම විසින් කෙළින්ම බැංකු ගිණුම් වලට යවනු ලැබේ.

ලෝක බැංකුවේ ඇස්තමේන්තුවලට අනුව ජනගහණයෙන් 40%කට වැඩි කොටසකට අයත් එක් පුද්ගලයෙක් දිනකට රුපියල් 225කට (ඩොලර් 2ක්) අඩු ප්‍රමාණයකින් ජීවත් වන ඇති රටක් වන ශ්‍රී

ලංකාවේ දී එක්සත් ජනපද රජය වැඩි අවධානයක් යොමු කර ඇත්තේ එහි සංවර්ධනයටත් ජීවිතය යත්තමින් ගැට ගසා ගැනීමට වෙර දරන කාන්තාවන්ට ආර්ථික ආධාර ලබා දීමත් කෙරෙහි ය. මෙම කාන්තාවන්ට එය මුදල් ඉපයීමක් පමණක් නොවේ. වැඩට ඒමේ අගය, අලුත් මිතුරන් හඳුනා ගැනීම, දුෂ්කර අවස්ථාවලදී එකිනෙකා දිරිගැන්වීම, පවුලේ හා ප්‍රජාව තුළ තීරණ ගැනීමේ දී හඬක් නැගීමට හැකි වීම හා ඔවුන්ගේ දරුවන් රැක බලා ගැනීමට හා අධ්‍යාපනය ලබා දීමට අවශ්‍ය මුදල් උපයා ගැනීම ආදි විවිධ කරුණු ද එයට අයත් වේ.

එක්සත් ජනපදයේ ජනාධිපති බැරැක් ඔබාමා 2014 දී කළ කථාවකදී කියා සිටියේ “රටක තත්වය මැනීමට හොඳ ක්‍රමය වන්නේ එය කාන්තාවන්ට සලකන ආකාරය“ බවයි. “සමහරු තවමත් කාන්තා ප්‍රශ්න ගැන කථා කරන්නේ ඒවා ආර්ථිකයට පිටින් ඇති දෙයක් ලෙසයි. - එම අදහස විකාරයකි- කාන්තාවන් සමෘද්ධිමත් වන විට ඇමරිකාව සමෘද්ධිමත් වේ. එය ඉතා සරල සත්‍යයකි“

අපේ ලෝකයට එහි පූර්ණ හැකියාව සාක්ෂාත් කර ගත හැකි වන්නේ ඔවුන්ගේ හැකියාවන් වර්ධනය කර ගැනීමට කාන්තාවන් හා ගැහැනු දරුවන් බලවත් කිරීමෙන් පමණි. ඇත්ත වශයෙන් ම කාන්තාවන් සාර්ථකත්වයට පත් වන විට සෑම තැනකම සමාජයන් ද දියුණු වනු ඇත.